# නිවේදනයයි

## 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත

ඉහත පනත යටතේ මෙම ආයතනයට අදාල තොරතුරු ලබාගැනීම සඳහා පහත සඳහන් තොරතුරු නිලධාරීන් වෙත **RTI 01** දරණ අයදුම් පත්‍රය මගින් අයදුම් කළ හැකිය. මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීම අනිවාර්ය.

<u>තොරතුරු නිලධාරීන්</u>

| | |
|---|---|
| නම | - ඩබ්.එම්.ටී.යූ.විජේරත්න මිය |
| තනතුර | - සහකාර ප්‍රාදේශීය ලේකම් |
| ලිපිනය | - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අකුරණ |
| දුරකථන අංකය | - **0812300504/0718201054** |
| විද්‍යුත් තැපැල | - akuranaaa@gmail.com |

## තොරතුරු ලබාගැනීම සඳහා ක්‍රියාකළ යුතු ආකාරය...

1. තොරතුරු ලබාගැනීමට ලිඛිත **RTI 01** අයදුම් පත්‍රය හෝ ලිපියක් හෝ වාචික ඉල්ලීමක් තොරතුරු නිලධාරියා වෙත ඉදිරිපත් කර ලැබුණු බවට ලිපියක් ලබාගන්න.
2. ඔබේ ඉල්ලීමට අදාල තොරතුරු සැපයිය හැකිද යන්න පිළිබඳව හැකි ඉක්මනින් , කෙසේ වුවද දින 14 ක් තුළ දන්වනු ලැබේ.
3. ඉල්ලා සිටින ලද තොරතුරු ඔබට දීමට තීරණව කළහොත් කොමිෂන් සභාව නියම කළ ගාස්තුවක් ගෙවිය යුතු නම් එය ඔබට දන්වනු ඇත. තොරතුරු ලබාගැනීමට ගෙවීමක් කළ යුතු නම් ඒ අනුව ගාස්තු ගෙවීම මත හෝ ගාස්තු ගෙවිය යුතු නොවේ නම් ගාස්තු රහිතව දින 14 ක් ඇතුලත තොරතුරු ලබා දෙනු ඇත.
4. ගාස්තු ගෙවීමෙන් පසු දින 14 ක් තුළ තොරතුරු ලබාදීමට අපහසු වේ නම් තොරතුරු නිලධාරියා විසින් එකී කාලය දීර්ඝ කිරීමට අවශ්‍ය හේතු සඳහන් කරමින් දින 21 ට නොවැඩි අතිරේක කාලයක් තුල ඔබ ඉල්ලා සිටි තොරතුරු ඔබට ලබා දෙනු ඇත.
5. තොරතුරු ලබාගැනීම සඳහා වන ඉල්ලීම යම් පුරවැසියෙකුගේ ජීවිතය සහ පුද්ගලික නිදහස සම්බන්ධයෙන් වන අවස්ථාවක ඉල්ලීම් සඳහා ප්‍රතිචාර දැක්වීම ඉල්ලීම ලැබී පැය 48 ක් තුල සිදු කරනු ඇත.
6. තොරතුරු ලබා ගැනීම සඳහා කරන ලද ඉල්ලීමකට අදාලව
   I. තොරතුරු ඉල්ලීම සඳහා කරන ලද යම් ඉල්ලීමක් භාරගැනීම ප්‍රතික්ෂේප කිරීම
   II. පනතේ 5 වැනි වගන්තිය යටතේ ප්‍රදානය කිරීමෙන් මුක්ත කර ඇති තොරතුරු හේතුවෙන් යම් තොරතුරක් වෙත ප්‍රවේශ වීම සඳහා අවස්ථාව ලබා දීම ප්‍රතික්ශේප කිරීම
   III. පනත මගින් නිෂ්චිතව දක්වා ඇති කාලසීමාවන්ට අනුකූල නොවීම.
   IV. සම්පූර්ණ නොවූ නොමග යවන හෝ සාවද්‍ය තොරතුරු ප්‍රදානය කිරීම
   V. වැඩිපුර ගාස්තු අය කිරීම.
   VI. ඉල්ලා සිටිනු ලබන ආකෘතියෙන් තොරතුරු සැපයීමට තොරතුරු නිලධාරියා විසින් ප්‍රතික්ෂේප කිරීම.
   VII. එම තොරතුරු වෙත එම පුරවැසියා ප්‍රවේශවීම වැළැක්වීම සඳහා එම තොරතුරු විකෘතිකර විනාශ කර හෝ අස්ථානගත කර ඇති බවට තොරතුරු ඉල්ලා සිටිනු ලබන පුරවැසියා හට සාධාරණ හේතු පැවතීම මත අතෘප්තියට පත්වන්නේ නම් පහත සඳහන් නම් කළ නිළධාරියා වෙත දින 14 ක් තුළ අභියාචනාවක් ඉදිරිපත් කරන්න.

| | | |
|---|---|---|
| <u>නම් කළ නිලධාරියා</u> | නම | - ඩී.ආර්.කේ.හෙන්නායක මෙය |
| | තනතුර | - ප්‍රාදේශීය ලේකම් |
| | ලිපිනය | - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, අකුරණ |
| | දුරකථන අංකය | - 0812300504/0767743856 |
| | විද්‍යුත් තැපැල | - akuranaaa@gmail.com |